# චික් චික් හූණෝ හා චෙක් චෙක් දේශපාලනඥයෝ

සුනාමිය හේතුකොටගෙන මතු වූ සංස්කෘතික අංග ගැන තවත් ලිවීමට බොහෝ දේ ඇතත් සුනාමිය පසුපස එන දේශපාලන සුනාමිය හේතුකොටගෙන එයට බාධක පැමිණෙයි. එහෙත් ඒ දේශපාලන කරුණු ගැන කතාකිරීමට පෙර එක් සිතිවිල්ලක් සඳහන් නොකරම බැරි ය. අද විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ ඇමතිවරයා ඇතුළු බොහෝ විද්‍යාඥයන් යැයි හැඳින්වෙන පිරිස් සුනාමි තොරතුරු ජාලයට නොපමාව සම්බන්ධවීමට කතාකරනු පෙනෙන්නට ඇත. මේ විද්‍යාඥයන් යැයි කියන අය තම තමන්ගේ ක්ෂෙත්‍රවල මූලික දැනුමට එකතුකර ඇති කිසිවක් නැත. ඔවුන්ට විද්‍යාඥයන් කීම ප්‍රශ්නයක් වුව ද බටහිරයෝ අප වැනි රටවල සිටින එවැන්නට ද විද්‍යාඥයන් යැයි කියති. එමගින් අපට තරමක ආත්මපිම්බීමක් ඇතිවන බව සැබෑ නමුත් බටහිර විද්‍යාවේ වර්ධනයට හෝ අපේ විද්‍යාවක වර්ධනයට හෝ රටට හෝ ඉන් තඹ දොයිතුවක වැඩක් නො වෙයි. කෙසේ වෙතත් ඇතැම් පුවත්පත්වල තවමත් මෙරට භූවිද්‍යාඥයන් යැයි කියන්නන්ට සුනාමිය පිළිබඳ තොරතුරු කල්තබා නොදැන්වීම ගැන දොස් පවරනු දැකිය හැකි ය. එසේ දොස් පවසන අතර ම ඒ පුවත්පත් ඒ ඊනියා විද්‍යාඥයන් ම අපේ දැනුමක් ගැන කියන්නන්ට ගැරහීමට යොදාගනු ද දැකිය හැකි ය.

අප කලින් ද කියා ඇති පරිදි අපේ විද්‍යාඥයන් යැයි කියන්නන්ට සුනාමියට පෙර රික්ටර් මාපකය කියවා නොව නැගෙනහිර වෙරළට සුනාමිය වැදීමෙන් පසුවවත් ඒ ගැන යමක් කීමට නො හැකිවිය. නැගෙනහිර වෙරළට පසුව බටහිර වෙරළට සුනාමිය කඩාවදින බව පැවසීමටවත් ඔවුන්ට නො හැකි විය. එහෙත් ඒ අඩුපාඩුව සිදුවූයේ ඔවුන්ට පමණක් නො වෙයි. ඉන්දියාව ද ඇතුළු මේ කලාපයේ සුනාමියෙන් බැට කෑ සියළු රටවල විද්‍යාඥයෝ එහි දී තම නොදැනුවත්කම පෙන්වූහ. එදින ඒ පැය කිහිපය ඇතුළත මුළු මහත් බටහිර විද්‍යාවම අසරණ විය. අර පුවත්පත් ඒ බව නොකියා ඊනියා විද්‍යාඥයන්ට බැටදෙන්නේ බටහිර විද්‍යාව ආරක්ෂාකිරීමට ය. ඒ අවිඥානිකව සිදුවන දෙයක් විය හැකි ය. එහෙත් ඉන් පිළිබිඹුවන්නේ තමන් අධිරාජ්‍යවිරෝධී යැයි කියාගන්නා මේ මහත්වරුන් කෙතරම් දුරකට අධිරාජ්‍යවාදී දැනුමේ හා සංස්කෘතියෙහි වන්දිභට්ටයන් ද යන්න ය.

සුනාමිය ගෝලිය හෝ කලාපීය වශයෙන් සිදුවන ප්‍රපංචයක් වුව ද ඒ ගැන තොරතුරු දැන්විය හැක්කේ හා ඉන් ආරක්ෂාවිය හැක්කේ ප්‍රාදේශීයව ය. හවායි සුනාමි මධ්‍යස්ථානයෙන් දැන්වුව ද  ජනතාවට අත්දැකීමක් හෝ අභ්‍යාසයක් හෝ නැත්නම් ඔවුහු ආරක්ෂාකාරී ස්ථානවලට නොයති. මෙහි දී අපි අපේ දැනුම යොදා නොගත්තෙමු. දැනුදු අනාගතයේ දී හෝ ඒ දැනුම යොදාගැනීම සඳහා කිසිම පියවරක් ගන්නා බවක් නො පෙනෙයි.  බටහිර තාක්ෂණ විද්‍යවකින් (වෛද්‍ය විද්‍යාවෙන්) උපාධියක් ලබා ඇති අදාළ ඇමතිවරයාට අපේ දැනුමක් ගැන දැනුමක් නැති බව පැහැදිලි ය. කාවන්තිස්ස කුමරුන්ට කපුටන් සමග කතාකිරීමට හැකි වී යැයි කියනු ලැබෙයි. ඔහුට අඩුම තරමින් කපුටන් කියන්නේ කුමක්දැයි දැනගැනීමේ හැකියාව තිබෙන්නට ඇත. කුමාරයකුට එවැනි දැනුමක් තිබී නම් සාමාන්‍ය වැසියන්ගෙන් යම් පිරිසකට ද ඒ දැනුම තිබෙන්නට ඇත.

සතුන් ඒ ඒ අවස්ථාවල විවිධ ශබ්ද නගන බව අපි දනිමු. එහෙත් ඒ ඒ අවස්ථාවල සතුන් කියන්නේ කුමක්දැයි දැනගැනීමට තරම් දැනුමක් අපට නැත. සුනාමිය ඇතිවීමට පෙර විවිධ සතුන් විවිධ ශබ්ද නගමින් දිවගිය බවට තොරතුරු හෙළි වී ඇත. ඒ ඒ ප්‍රදේශවල සතුන්ගේ හඬ තේරුම්ගැනීමට හැකි පිරිස් අපට සිටියේ නම් බටහිර විද්‍යාව කඩා වැටීමෙන් සිදු වූ හානිය අවම කරගැනීමේ හැකියාව අපට විය. එවැනි පිරිස් අපට සිටි බව ඉතිහාසයෙන් පමණක් නොව වර්තමානයෙන් ද හෙළි වෙයි. හූණන් චික් චික් ගා ශබ්ද කළ විට ඇතැමුන් යම් වැඩක් ආරම්භකිරීමේ දී පසුබාන අපි දනිමු. මේ ක්‍රියාවට අද අපි සිනාසෙමු. එහෙත් මේ පසුපස යම් වැදගත් කරුණක් ඇති බව මගේ විශ්වාසය වෙයි.  අපි ඇතැම්විට හූණා කියන්නා වගේ යැයි කියමු. හූණා කියන දේ අසා උගේ ශබ්දයේ වෙනස්වීම් ගැන අවධානය යොමුකර ස්වභාව ධර්මය හෝ වෙනත් යමක් පිළිබඳ ඌට දැනෙන දෙය තේරුම්ගැනීමට සමත් අය මෙරට සිටින්නට ඇතැයි අපට සිතාගත හැකි ය. එහෙත් ඒ දැනුම නුවර යුගයේ හෝ ඒ ආසන්න කාලයක හෝ අපෙන් නැතිවී යන්නට ඇත. අද අපට ඉතිරිව ඇත්තේ ඒ විශේෂඥ දැනුමේ ඉතාමත් ම පරිහානියට පත්වූ තත්ත්වයක් පමණකි. අද අපි හූණන් කෙසේ කෑ ගැසුවත් ඒ අයහපත් යැයි කීමට පුරුදු වී සිටිමු. එය නිවැරදි නොවන නිසා ම බටහිර දැනුම කටගාගත් පංඩිතයන්ට එයට සිනහසීමේ අවස්ථාවද ලැබෙයි. ඒ දැනුම මිථ්‍යාවක් ලෙස හැඳින්වීමට ද

© Prof. Nalin De Silva

එවිට හැකිවෙයි. අප කළ යුත්තේ ඒ පරිහානික තත්ත්වයෙන් ඇති දනුමට පරිභවකිරීම නොව හැකිනම් හුණුහඬ පිළිබඳ විශේෂඥ දැනුමක් ඇතිකර ගැනීමට කටයුතු කිරීමයි. හුණුන් පමණක් නොව අනෙක් සතුන් ගැන ද කිවයුත්තේ එපමණ ය. අප අපේ දැනුමක් වර්ධනයකිරීම පසෙක තබා කරන්නේ රික්ටර මාපකයක් වැළඳගෙන බටහිර විද්‍යාවේ අගුපිලේ නිදාගැනීම ය.  එසේ නිදාගෙන සිටින අතර සුනාමියට හසුවීම පුදුමයක් නො වෙයි. එයට බටහිර භූවිද්‍යාඥයන්ට පමණක් බැණ වැදීමෙන් පලක් නැත.

ගම අමතක කළ කසිකබල් බණ්ඩලා බටහිර භූවිද්‍යාඥයන් විවේචනය කරමින් ලියන පුවත්පත්වලට මහේශාඛ්‍ය බටහිර දේශපාලන විද්‍යාඥයෝ ද ලියති. ඉන් එක් අයකු පසුගියදා ලියා තිබුණේ ඊනියා ආපදා කළමණාකරණය නිසි ලෙස කරගැනීමට ආණ්ඩුවට නොහැකිවූයේ මෙරට ඒකීය රාජ්‍යයක් ඇති නිසා බව ය. මොහුගෙන් ඉගෙනගන්නා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට බුෂ්ගේම පිහිට ය. තම ජීවිතයේ කිසිම දිනක මහපොළ උදාගම වැනි වූ සංකල්පයක් හෝ නිර්මානය කර නැති මේ දේශපාලන විද්‍යාඥයා යැයි කියාගන්නා තැනැත්තා හවායි උපාධියක් ලබා ගත්තෙකි. රික්ටර  පුහුණුවට ද ඇතැමුන් හවායි යැමට බලාපොරොත්තුවෙන් සිටින බවට සැකයක් නැත. කෙසේ හෝ වේවා ඒකීය රාජ්‍යයක් යනු අනිවාර්යයෙන්ම මධ්‍යගත පරිපාලනයක් ඇති රාජ්‍යයක් නො වෙයි. ව්‍යවස්ථාදායකය හා පරිපාලනය යනු එකක් නොව දෙකක් වෙයි. බ්‍රිතානියේ ඒකීය රාජ්‍යයේ තවමත් හොඳ මධ්‍යගත පරිපාලනයක් වෙයි. ඉන්දියාවේ රාජ්‍යය සන්ධීය ලක්‍ෂණ සහිත වුව ද පරිපාලනය මධ්‍යගත වෙයි. අපේ පැරණි එක් සේසත් රාජ්‍යය ඒකීය එහෙත් පරිපාලනය මධ්‍යගත නොවූ රාජ්‍යයකි. අද ලංකාවේ පරිපාලනය කඩාවැටී ඇත්තේ ඒකීය රාජ්‍ය ප්‍රශ්නයක් නිසා නොව මධ්‍යගත පරිපාලනය අප විසින් කඩා බිඳ දමනු ලැබ ඇති හෙයින් ය. මේ කරුණු පසුගිය සතිවල පැහැදිලි කෙරී ඇත.

මේ අතර අද ලංකාව බටහිර රටවල ඔත්තුකාරයන්ගේ කෙළිබිමක් බවට පත් වී ඇත. ඒ මදිවාට බටහිර දේශපාලනඥයෝ ද බුරුතු පිටින් මෙහි එති. කැනඩා අගමැති මාටින් මෙහි පැමිණියා පමණක් නොව කොටින්ගේ පාර්ලිමේන්තු  නියෝජිතයන් වූ දෙමළ ජාතික සංධානයේ මන්ත්‍රීවරුන් ද හමුවිය. ඔහු හමුවූ සම්බන්ධන් කියා ඇත්තේ කොටි ත්‍රස්තවාදීන් නොවන බවත් කොටි ළමා කඳවුරු පවත්වාගෙන යන්නේ දෙමව්පියන් නැති වූ ළමුන් සඳහා බව ය. දී කිරට බළල්ලුන් සාක්කි යැයි කියන්නේ මෙවැනි කතාවලට ය. එහෙත් කැනඩාවට යැමට වීසා නැති සම්බන්ධන්ලා ලංකාවේ දී මුණ ගැසීමට මාටින් ක්‍රියා කෙළේ කෙසේ ද? දැනටමත් කැනඩා විරුද්ධ පක්‍ෂ මන්ත්‍රීවරයකු මාටින්ගේ මේ ක්‍රියාව විවේචනය කර ඇත. මාටින් කියා ඇත්තේ අම්පාර දිස්ත්‍රික්කයේ දෙමළ ජනයා හා ආණ්ඩුව අතර සම්බන්ධීරණයක් ඇතිකිරීමට කැනඩාව ක්‍රියාකළුන බව ය, එහෙත් එවැනි සම්බන්ධයක් ඇතිකිරීමට මාටින් තබා බෝටින්වත් අවශ්‍ය නැත. සුනාමියෙන් පසුව මේ පළාත්වල දෙමළ ජනයා හා හමුදාව අතර ඉතා යහපත් සම්බන්ධතාවක් ගොඩ නැගී ඇත. මාටින්ලා කුමක් කීවත් කරනු ඇත්තේ ඒ සම්බන්ධය බිඳ දැමීම ය.

කැනඩා අගමැතිට අමතරව එහි විදේශ ඇමති ද දෙමළ ජාතිවාදය නිසා ඇති වී තිබෙන තත්ත්වයට මැදිහත්වීමට උත්සාහ කරයි. ඔහු නෝර්වේ විදේශ ඇමතිට කියා ඇත්තේ තමාට ද මේ ප්‍රශ්නයේ දී කාර්යභාරයක් කිරීමට ඇති බව ය. ඒ අතර නෝර්වේ රටින් සොල්හයිම් සහ ඇමතිවරු මෙරටට එති. ඉතා පැහැදිලිව ඊනියා සාමය සඳහා සාකච්ඡා ඇතිකිරීමට පසුබිම සකස්කිරීමේ ව්‍යායාමයක මේ සියල්ලෝ ම යෙදී සිටිති. එහි අවසානයේ ඇත්තේ ඊනියා අන්තර්වාර පාලන ඒකාධිකාරිය හා ඊළම ය. බටහිර ක්‍රිස්තියානි අධිරාජ්‍යවාදයට සුනාමි දියේ මාළු බෑමේ ඉඩකඩ ලැබී ඇත්තේ මෙරට දේශපාල නායක නායිකාවන්ගේ කොන්දේ ස්වභාවය හේතුකොටගෙන ය. උතුරු හා නැගෙනහිර පළාත්වල කෙතරම් හොඳින් සහන වැඩ කෙරුණ ද ප්‍රභාකරන් සෑම විටම පවසනු ඇත්තේ ආණ්ඩුව උතුරට හා නැගෙනහිරට නොසලකන බව ය. එසේ නොකීවහොත් ප්‍රභාකරන්ගේ අන්තර්වාර පාලන ඒකාධිකාරයට ඉල්ලුමක් නැතිවනු ඇත. එහෙත් මේ අතර උතුරු හා නැගෙනහිර පළාත්වලින් දෙමළ ජනයා තව තවත් පිටරට යැමට උත්සාහ කරති. සුනාමිය ද උපයෝගී කරගනිමින් මොවුන් පිටරට යැමට උත්සාහකරන්නේ ප්‍රභාකරන්ගෙන් තරමක් හෝ ගැලවීමට ය. ඔවුන්ට ඔහුගෙන් මුළුමනින්ම ගැලවීමට නොහැකිවනු ඇත්තේ ලෝකයේ කොහේ සිටියත් ප්‍රභාකරන් දෙමල ජනයාගෙන් කප්පම් ලබාගන්නා බැවින් ය. අද ආණ්ඩුව කළ යුත්තේ බටහිරින් තව තවත් දේශපාලනඥයන් ගෙන්වාගැනීම නොව ඇති වී තිබෙන තත්ත්වය ප්‍රයෝජනයට ගෙන ප්‍රභාකරන් නැතිකිරීමට පියවර ගැනීම ය. එහෙත් ඊනියා ආධාර ගැන සිහින මවන දේශපාලනඥයන්ට හා ඔවුන්ගේ හෙංචයියන්ට ප්‍රභාකරන් නැතිව පැවැත්මක් නැත.

© Prof. Nalin De Silva